# දැන්වීමයි

## සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම

## විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2019/ 2020 අධ්‍යයන වර්ෂය

## දෘශ්‍ය කලාවේදී/ ප්‍රාසංගික කලාවේදී (සංගීත / නර්තන/ නාට්‍ය හා රංග කලාව) විශේෂ උපාධි පාඨමාලා

### (2019 අපොස (උ. පෙළ) ප්‍රතිඵල මත)

2019/ 2020 අධ්‍යයන වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමට 2019 වර්ෂයේ පැවති අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර ඇති අපේක්ෂකයින්ගෙන්, යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම්

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය, අධ්‍යයන වර්ෂය 2019/ 2020 (අ.පො.ස (උසස් පෙළ) විභාගය 2019)" ශිෂ්‍ය අත්පොතේ 1 කොටසේ 1.2 ඡේදය යටතේ ඇති විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් සපුරා ඇති

සහ

චිත්‍ර හා මූර්ති කලා/ සංගීතය/ නර්තනය / නාට්‍ය හා රංග කලාව යන විෂයයන්ගෙන් හැදෑරීමට බලාපොරොත්තු වන අධ්‍යයන පාඨමාලාවට අදාළ විෂයට 2019 අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් සහිතව පෙනී සිටි විෂයයන් තුනෙන්ම සමත්ව සිටීම.

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය ඉහත කී අවම සුදුසුකම් ඇති සිසුන් ඊට අමතරව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබීම සඳහා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත්විය යුතුය.

02 අයදුම් කළ යුතු ආකාරය

අයදුම්කරුවන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවිය වන **www.vpa.ac.lk** හි ඇති අයදුම්පත මාර්ගගත ක්‍රමයට (Online) සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. එසේ මාර්ගගත (Online) අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමට අමතරව බාගත කරන ලද (Downloaded) අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපතක් පහත සඳහන් ලියවිලි සමග 2020.07.08 හෝ එදිනට පෙර මතු සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර "සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2019/2020" හා "අයදුම්කරන පාඨමාලාව" සඳහන් කළ යුතුය.

**සහකාර ලේඛකාධිකාරී / අධ්‍යයන හා ශිෂ්‍ය සේවා,**
**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,**
**නො. 21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07.**

යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් එක් පාඨමාලාවක් සඳහා රු. 1,500/= ක ගාස්තුවක් අය කරනු ලැබේ. එම මුදල සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නමින් ලංකා බැංකුවේ නිදහස් චතුරශ්‍ර ශාඛාවේ ඇති අංක 84072227 දරන ගිණුමට බැර වන පරිදි ගෙවිය යුතුය.

අ.පො.ස. (උ. පෙළ) සෞන්දර්ය විෂයයන් දෙකක් සඳහා පෙනී සිට එම විෂයන් දෙකෙන්ම යෝග්‍යතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් වෙන වෙනම එම පාඨමාලා සඳහා ප්‍රායෝගික පරීක්ෂණ ගාස්තු ගෙවීම සහ අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

3. අයදුම්පත්‍රය සමග පහත දැක්වෙන ලියකියවිලි අමුණා එවිය යුතුය.

අයදුම්පත සමග ඔබගේ නම හා ලිපිනය ලියන ලද අඟල් 9X4 ප්‍රමාණයේ රු. 70/= ක් වටිනා මුද්දර ඇලවූ ලිපි කවරයක්, බැංකුවට මුදල් ගෙවන ලද වවුචරයේ මුල් පිටපත, ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපතක් සහ 2019 අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය. උසස් පෙළ ප්‍රතිඵල ලේඛනය, පාසල් අයදුම්කරුවන් විදුහල්පති විසින්ද, බාහිර අයදුම්කරුවන් විහාරාධිපති වහන්සේ කෙනෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සහතික කර අමුණා එවිය යුතුය. වෙනත් කිසිදු ලියවිල්ලක් අයදුම්පතට අමුණා එවීම අවශ්‍ය නොවන අතර,

මුදල් ගෙවන ලද වවුචරයේ ඡායා පිටපත් භාරගනු නොලැබේ.

4. විශ්වවිද්‍යාල ප්‍රවේශයට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් හෝ නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි අවස්ථාවක දී අයදුම්කරුවන් විසින් ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

5. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින සියලුම සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අයදුම්කර තිබිය යුතුය.

6. මෙම යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනයන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙත යථා කාලයේදී පෞද්ගලිකවම දන්වනු ලබන අතර, මෙම යෝග්‍යතා පරීක්ෂණය සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

**ලේඛකාධිකාරී, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,**
**21, ඇල්බට් චන්ද්‍රවංශය, කොළඹ 07.**
**දු.ක.අ. 011-2033710**
**2020.06.18**

© 2020 All Rights Reserved. Powered by *Summit (http://www.summitindia.com)*